# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය

සුදුසුකම් : 1. තාක්ෂණ විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDT) හෝ ඊට සමාන සුදුසුකම්.

**හෝ**

2. ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් (HNDE)

**හෝ**

3. අදාළ විෂයය ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාවක්

**හෝ**

4. පිළිගත් ආයතනයක අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර 02 පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් සහ අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක්

වැටුප් පරිමාණය : රු. 35,145 – 7 X 355; 9 X 470 - 41,860 [U-MT 1 (II)]

**සටහන : පුරප්පාඩු පවතින අධ්‍යයනාංශ පහත දැක්වේ අයදුම් කරන තනතුර ඉදිරියෙන් තමන් අයදුම් කරනු ලබන අධ්‍යයනාංශය ද අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර යම් අයදුම්කරුවෙකු අධ්‍යයනාංශ කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.**

1. මනෝවිද්‍යා හා උපදේශන අධ්‍යයනාංශය
2. හෙද විද්‍යා අධ්‍යයනාංශය
3. සෞඛ්‍ය අධ්‍යාපන හා පර්යේෂණ අධ්‍යයනාංශය
4. සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය
5. ජේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනාංශය
6. යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය

### තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය

සුදුසුකම් : (i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම.

සහ

(ii)

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාළව, ජාතික වෘත්තීය නිපුණතා (National Vocational Qualification) 5 වෙනි මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුණතා සහතිකපත් ලබා තිබීම.

හෝ

(ආ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ඉහත (ii) (අ) කොටසෙහි සුදුසුකම්වලට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාළව ලබා ගත් තාක්ෂණික සුදුසුකම් සමඟ පිළිගත් ආයතනයකින් ලබාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : රු. 31,625 - 7 X 300; 10X355 – 37,275 [U-MT 1 (III)]

### තාක්ෂණික නිලධාරී (තොරතුරු තාක්ෂණ) III ශ්‍රේණිය

සුදුසුකම් : (i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම.

සහ

(ii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ/තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයකින් හෝ නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය නිපුණතා (National Vocational Qualification) 5 වෙනි මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුණතා සහතිකපත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

සටහන : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ රැකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් පරිමාණය : රු. 31,625 - 7 X 300; 10X355 – 37,275 [U-MT 1 (III)]

**සටහන : 2019.05.26 දින සිළුමිණ පුවත්පතෙහි පලකරන ලද දැන්වීමට අනුව මෙම තනතුර සඳහා අයදුම් කළ අය නැවත අයදුම් කළ යුතු වේ.**

### පරිපාලක (විදුලි) III ශ්‍රේණිය
### පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය

සුදුසුකම් : (අ) තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය හෝ සමාන සුදුසුකමක් සමඟ වසර 03ක පළපුරුද්දක් තිබීම. (අදාළ පළපුරුද්ද පාඨමාලාව හදාරන ලද කාලය තුළදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.)

හෝ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් සමත්වීම හා රාජ්‍ය/පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරීක්ෂක-වරයෙකු ලෙස වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : රු. 31,625 - 7 X 300; 10X355 – 37,275 [U-MT 1 (III)]

**සටහන : 2019.05.26 දින සිළුමිණ පුවත්පතෙහි පලකරන ලද දැන්වීමට අනුව මෙම තනතුර සඳහා අයදුම් කළ අය නැවත අයදුම් කළ යුතු වේ.**

### පරිගණක ක්‍රියාකරු (II ශ්‍රේණිය)

සුදුසුකම් : (1) අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භෞතික විද්‍යාව හෝ විද්‍යාව සහ ගණිතය යන විෂයයන් දෙක ඇතුළත්ව සම්මාන සාමාර්ථ පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) සමත් විය යුතුය.

(2) පරිගණක ක්‍රියා කරවීම සම්බන්ධයෙන් වසර 02 කට නොඅඩු පළපුරුද්ද හෝ විද්‍යුත් කාර්මික උපකරණ භාවිතය. අළුත්වැඩියාව සහ නඩත්තුව පිළිබඳව අවුරුදු තුනක (03) පළපුරුද්ද.

වැටුප් පරිමාණය : රු. 31,625 - 7 X 300; 10X355 – 37,275 [U-MT 1 (III)]

### සැලසුම්කරු (පහළ ශ්‍රේණිය)

සුදුසුකම් : රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැලසුම්කරණය පිළිබඳ විභාගයකදී සැලසුම්කරුවකු ලෙස සුදුසුකම් ලබා තිබීම.

වැටුප් පරිමාණය : රු. 31,625 - 7 X 300; 10X355 – 37,275 [U-MT 1 (III)]

### ආරක්ෂක පරීක්ෂක (II ශ්‍රේණිය)

සුදුසුකම් :

1. (අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ.) විභාගය සමත් වී තිබිය යුතුය. සම්මාන සාමාර්ථ ලත් විෂයයන් අතරට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළත් විය යුතුය.

හෝ

(ආ) තෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් අ.පො.ස. සා.පෙළ විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. අ.පො.ස. සා.පෙළ විභාගයේදී සමත් විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළත් විය යුතුය.

සහ

2. පොලිස්/යුධ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

3. ක්‍රීඩාවන්හි ක්‍රියාශීලී ලෙස සහභාගී වී තිබීම.

4. උස : අඩි 05 අඟල් 04 ට නොඅඩු විය යුතුය.
   පපුව : අඟල් 34 ට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)

වැටුප් පරිමාණය : රු. 30,725 - 17 X 300– 35,825 [U-MN 1 (III)]

මෙම තනතුරු සඳහා මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ගෙවනු ලැබේ.

- ජීවන වියදම් දීමනාව (රු. 7,800/=)
- අතිරේක මාසික දීමනාව (20%)
- මාසික අන්තර් දීමනාව (45%)

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

තමාගේ නම සහ ලිපිනය ලියන ලද සෙ.මී. 23 x 10 ප්‍රමාණයේ මුද්දර කවරයක් 2021.02.25 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නාවල, නුගේගොඩ ලිපිනයට එවීමෙන් හෝ ආයතන අංශය වෙත පැමිණ අයදුම්පත් ලබා ගත හැකි අතර **අයදුම්පත් සහ විස්තර https://www.ou.ac.lk/vacancies/ වෙතින් ද ලබාගත හැක.** විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන ලද අයදුම්පත් හැර වෙනත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නාවල, නුගේගොඩ යන ලිපිනයට **2021.03.05 දින හෝ එදිනට පෙර ලැබෙන සේ** එවිය යුතුය. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය. අයදුම්පත් සමඟ සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, සහතිකවල පිටපත් අමුණා නොතිබීම, අපැහැදිලි බව හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යලි සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ

2021.02.14

University Web Site : www.ou.ac.lk

Source: Silumina (2021.02.14)